# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2028/6 - 2017 ජූලි මස 17 වැනි සඳුදා - 2017.07.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මල්, විසිතුරු පැල, එළවළු සහ පළතුරු වගා කිරීමේ සහ අපනයනය කිරීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1)(අ) වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ 2015 මැයි මස 27 දින අංක 1916/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව ඉහත කී ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ කම්කරු කොමසාරිස් විසින් මල්, විසිතුරු පැල, එළවළු සහ පලතුරු වගා කිරීමේ සහ අපනයනය කිරීමේ කර්මාන්තයේ නියුක්ත සේවකයින් සම්බන්ධයෙන් පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අවම වේතන ප්‍රමාණය පිළිබඳව ගන්නා ලද තීරණය ගරු කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යතුමන් විසින් අනුමත කරන ලද බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 33(3) වන වගන්තිය සමග කියවෙන 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2017 අගෝස්තු මස 01 දින සිට වලංගු විය යුතු ය.

එස්. ජී. එන්. සරණතිස්ස,
ලේකම්,
කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය.

2017 ජූලි මස 13 වැනි දින,
කොළඹ 05,
කම්කරු මහ ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

*I කොටස*

මල්, විසිතුරු පැල, එළවළු සහ පලතුරු වගා කිරීමේ සහ අපනයනය කිරීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව 2012 මාර්තු මස 09 වැනි දින 1748/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති පහත I කොටසේ සඳහන් සේවා බාණ්ඩ සඳහා ගෙවිය යුතු අවම වැටුප් පිළිබඳ II කොටසේ සඳහන් පරිදි තීරණ ගැනීමට එකී පඩි පාලක සභාව අදහස් කරනු ලැබේ.

1A - PG 3611 — 607 (2017/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*පුහුණු :-*

පටක හා බීජ රෝපනයේ නියැලෙන්නන්, බද්ධ කිරීමේ කටයුතුවල නියැලෙන්නන්, අපනයනය හා විකිණීම පිණිස මල්පැල, මල් හා මල් අතු සකසන්නන්, විසිතුරු පැල, අතු හෝ රිකිලි සකසන්නන්, තත්ත්ව පරීක්ෂාවේ යෙදෙන්නන්, දිලීර නාශක, කෘමිනාශක හා පොහොර යොදන්නන්, ඇසිරීමේ කාර්යයන්හි නියුක්ත සේවකයන්, ගබඩාකරුවන්, සේවක පරිපාලනයේ යෙදෙන්නන්, පුහුණුවක් අවශ්‍ය කාර්යයන් හී නියැලෙන්නන්,

*අර්ධ පුහුණු :-*

තවාන් දැමීම, පැල සිටුවීම හා වගාව නඩත්තු කරන සේවකයන්, එළදාව නෙලන්නන් සහ එකතු කරන්නන්, ගබඩා සහයකයින්, අර්ධ පුහුණු වෙනත් සේවකයන්

*නුපුහුණු :-*

වගාව පිණිස භූමිය සකස් කරන සේවකයන්, පැටවීමේ බෑමේ නියුක්ත කම්කරුවන්, පුහුණුවක් අවශ්‍ය නොවන වෙනත් සේවයන්හී නියැලෙන්නන්

**II කොටස**

ගෙවිය යුතු අවම වේතනය

| | දෛනික<br>*රු. ශත.* |
|---|---|
| නුපුහුණු | 400.00 |
| අර්ධ පුහුණු | 460.00 |
| පුහුණු | 500.00 |

08 - 07

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.